Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2013 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 ஜூலி
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2013

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලු සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. නුගේගොඩ විජේරාම ප්‍රදේශයේ ජීවත්වන ශෙනාල් මෙවර උසස් පෙළ හදාර සිටින තරුණයෙකි. ඔහු තම මිතුරන් වන හංස හා ජීවක සමග එකතුව ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි. ඔවුන් අතර ඇති වූ සාකච්ජාවක් පහත වේ.

ශෙනාල් : මගේ බැංකු පොතේ රු. 300,000ක් තියෙනවා. මං හිතන් ඉන්නේ ඒකෙන් හොඳ ව්‍යාපාරයක් අරඹන්න.

හංස : ඔව් ශෙනාල් ඒක හොඳයි. විජේරාම හංදියේ අපේ කඩ කාමරේ අපිට ව්‍යාපාරයක් පටන් ගන්න පුලුවන්. ඒත් අපි මොනවද කරන්නේ...

ජීවක : කැම්පස් එකත් ලග නිසා Book Shop එකක් දැම්මොත් හොඳ නැද්ද ?

ශෙනාල් : ඔව් ඒක හොඳයි. අපි "සංහිඳ" කියලා නම දාමු ද ?

හංස : අපිට බැංකු ණයකුත් ගන්න පුලුවන්නේ... වගකීම සීමිත ව්‍යාපාරයක් නම් වැඩිය හොඳයි නේද?

ජීවක : ඔව්. ඒක හොඳියි..

මෙම සාකච්ජාවෙන් පසු ශෙනාල්, හංස හා ජීවක පිළිවෙලින් රු. 300,000, රු. 50,000 ක් හා රු. 250,000ක් හා හංස තමා සතු රු. 150,000 ක් වටිනා කඩ කාමරයද යොදාගෙන ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

ඔවුන් රු. 100,000 ක බැංකු ණයක් ලබා ගත් අතර ෆොටෝ කොපි යන්ත්‍ර 2ක් එකක් රු. 60,000 බැගින් මුදලට ගන්නා ලදි.
තවද තම මිතුරෙකු වූ අමිලගෙන් පොත් රාක්ක 3ක් රු. 30,000කට ණයට ලබා ගන්නා ලදි.

ඔවුන් ව්‍යාපාරයේ පළමු වසර තුළ රු. 350,000 ක වටිනා විකුණුම් කර තිබූ අතර රු. 175,000 ක් ගැණුම් කර තිබුණි. විදුලි වියදම් 15,000ක් වූ අතර දුරකථන බිල රු. 10,500 ක් විය. විශේෂයෙන් සඳහන් කොට නැත්නම් සියලු ගනුදෙනු මුදලින් බව සලකා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

01. ඔබ සිතන ආකාරයට මොවුන්ගේ අභිප්‍රායට අනුව ගැලපෙන ව්‍යාපාර සංවිධානය කුමක්ද ?

02. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද ? කල යුතු නම් කුමන පනතක් යටතේ ද?

03. මෙම ව්‍යාපාරය ආරම්භයට පෙර ඔවුන් සකස් කල යුත්තේ කුමක් ද? එහි මූලිකාංග මොනවාද ?

04. මෙම ව්‍යාපාරයට බලපෑම් කළ හැකි බාහිර පරිසර සාධක මොනවා ද?

05. ව්‍යාපාරය රක්ෂණය කිරීමට අදහස් කරයි නම් ඔවුන් ආවරණය කළ යුතු අවදානම් 2ක් දක්වන්න.

06. ඉහත සිද්ධිය ඇසුරෙන් ගනුදෙනු 5ක් තෝරා ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම දක්වන්න.

**වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්**

07. මෙම ව්‍යාපාරයේ බාහිර වගකීම් ප්‍රමාණය කොපමණද?

08. ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු මුදල් පොතක දක්වන්න.

09. ව්‍යාපාරයේ වර්ෂ අවසානයේ ලාභය කොපමණද ?

10. "සංහිඳ" ව්‍යාපාරයේ මාසය අවසානයේ මුදල් පොතේ බැංකු ශේෂය රු. 729,500 ක් විය. එදිනට බැංකු ප්‍රකාශයේ බැංකු ගාස්තු රු. 750ක් ලෙස සටහන් ව තිබුණි. බැංකු ප්‍රකාශයේ සටහන්ව නොතිබූ මුදල් පොතේ බැරට සටහන් වූ චෙක්පත්වල වටිනාකම රු. 10,500කි. මුදල් පොතේ හරට සටහන් ව මාසය අවසානයේ බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ චෙක්පත් වටිනාකම රු. 6,000කි. ඒ අනුව බැංකු ප්‍රකාශයේ ශේෂය කීය ද?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. (i) ඉතිරිකිරීමේ ගිණුමකට සාපේක්ෂව ස්ථාවර තැන්පත් වල ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකි වාසි 2ක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) වාණිජ බැංකුවක ප්‍රධාන තැන හිමිවන ගිණුම නම් කර, එම ගිණුමේ ඇති ලක්ෂණ 2ක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(iii) පාන් නිෂ්පාදනය කරන බේකරියක අපේක්ෂිත පාන් නිෂ්පාදන පිරිවැය තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

නිපදවීමට අපේක්ෂිත පාන් ගෙඩි ගණන 1000

| | |
|---|---|
| පාන් පිටි | 18,500 |
| මාගරින් | 8,000 |
| විදුලිය | 6,500 |
| බේකරි කුලිය | 5,000 |
| යන්ත්‍ර | 10,000 |
| පාන් සාදන්නාගේ කුලිය පාන් ගෙඩියකට | රු. 10 |
| යන්ත්‍ර ක්ෂය වීම 20% | |

අ. ඇස්තමේන්තු ගත මුලු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න *(ලකුණු 02 යි)*

ආ. නිපදවන ලද එක් පාන් ගෙඩියක ඇස්තමේන්තු ගත නිෂ්පාදන වියදම ගණනය කරන්න. *(ලකුණු 02 යි)*

ඉ. 20% ලාභ තබාගෙන පාන් විකිණීමට අපේක්ෂා කරයි නම් එක් පාන් ගෙඩියක විකුණුම් මිල සොයන්න. *(ලකුණු 02 යි)*

03. (i) සමාගම් පනතට අනුව සමාගමක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියවිලි මොනවා ද?

(ii) වාණිජ බැංකුවක් සලසන සේවා 4ක් නම් කරන්න.

(iii) සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බලන ප්‍රධාන සාධක 4ක් නම් කරන්න.

(iv) චෙක්පත් වර්ග නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(v) අනේවාසික විදේශ මුදල් ගිණුමක් යනු කුමක් ද? *(ලකුණු 02 x 05 = 10 යි)*

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04. අ. 2013 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2013 ජනවාරි | 01 | ප්‍රාග්ධනය යෙදුවා | රු. 400,000 |
| | 05 | අත්පිට මුදලට භාණ්ඩ ගැනීම | රු. 60,000 |
| | 08 | යන්ත්‍රයක් මිලට ගත්තා | රු. 110,000 |
| | 12 | පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගත්තා | රු. 8,000 |
| | 18 | අත්පිට මුදලට භාණ්ඩ විකිණීම | රු. 80,000 |
| | 27 | ණයට භාණ්ඩ වික්කා | රු. 70,000 |
| | 29 | ණයට විකුණු භාණ්ඩ ආපසු එවුම් | රු. 20.000 |

**ඉහත සදහන් ගනුදෙනු,**

1. ලෙජර් ගිණුම් වල සටහන් කර තුලනය කර දක්වන්න.
2. 2013.0.31 දිනට ශේෂ පිරික්සුම පිළියල කරන්න.

*(ලකුණු 05 යි)*

ආ. අශේන්ගේ ව්‍යාපාරයේ 2013 වර්ෂයේ ජනවාරි මාසයේ සිදුවූ සුලු වියදම් ගනුදෙනු කිහිපයක් මතු දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 01 | ඉදිරියට ගෙන ආ සුලු මුදල් ශේෂය<br>අග්‍රිමය ප්‍රතිපූරණය කළා. | රු. 930 |
| | 04 | මුද්දර කවර ගත්තා | රු. 120 |
| | 08 | ගමන් ගාස්තු ගෙව්වා | රු. 70 |
| | 12 | අංජුලට ගෙව්වා | රු. 130 |
| | 17 | සංග්‍රහ ගාස්තු ගෙව්වා | රු. 80 |
| | 21 | ලිපි ලියාපදිංචි ගාස්තු | රු. 90 |
| | 25 | ලොරි කුලි ගෙව්වා | රු 200 |
| | 26 | විදුලි බිල ගෙව්වා | රු. 310 |
| | 29 | පරිත්‍යාග | රු. 80 |
| | 31 | අත ඉතිරි සුලු මුදල් ශේෂය<br>අග්‍රිමය ප්‍රතිපූරණය කළා. | රු. 120 |

තැපල්, ගමන්, විවිධ යන විශ්ලේෂණ තිරු භාවිත කරමින් ඉහත ගනුදෙනු සුලු මුදල් පොතක වාර්තා කරන්න.

*(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 10 යි)*

05. අ. 2013 ජුනි මාසයේ රඹාගේ ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තිරුව හා බැංකුව විසින් එවන ලද ප්‍රකාශණය පහත දැක්වේ.

**මුදල් පොත**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 14,500 | අමාෂ (වෙ. අ. 1121) | 3,632 |
| කවිෂ (වෙ. අ. 0082) | 8,400 | මනුෂ (වෙ. අ. 1122) | 5,964 |
| වෙනුෂ (වෙ. අ. 10056) | 9,600 | සන්තුෂ (වෙ. අ. 1123) | 2,933 |
| තරුෂ (වෙ. අ. 90058) | 5,200 | රවිෂ (වෙ. අ. 1124) | 6,341 |
| මලිෂ (වෙ. අ. 104321) | 4,600 | ශේෂය ප/ගෙ | 23,430 |
| | 42,300 | | 42,300 |

**බැංකු ප්‍රකාශණය**

| විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| ශේෂය | | | 14,500 |
| කවිෂ - වෙ. අ. 0082 | | 8,400 | 22,900 |
| මලිෂ - වෙ. අ. 104321 | | 4,600 | 27,500 |
| මනුෂ - වෙ. අ. 1122 | 5,964 | | 21,536 |
| ගෙවල් කුලි | 12,000 | | 9,536 |
| රවිෂ - වෙ. අ. 1124 | 6,341 | | 3,195 |
| ණයගැති ලැබීම් | | 6,500 | 9,695 |
| චෙක්පොත් ගාස්තු | 500 | | 9,195 |
| බැංකු ගාස්තු | 700 | | 8,495 |

**ඔබ විසින්,**

1. 2013 ජුනි 30 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය
2. 20013 ජුනි 30 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියල කරන්න.

*(ලකුණු 05 යි)*

ආ භාතියගේ ව්‍යාපාරයේ 2013.03.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම සමාන වුවද මතු සඳහන් වැරදි සොයා ගන්නා ලදි.

(i) කසුන්ගෙන් ලබා ගත් රු. 3,000 ක බඩු තොගය පිළිබඳ කිසිදු සටහනක් තබා නොමැත.

(ii) රු. 2,000 ක යන්ත්‍ර අලුත් වැඩියාව, යන්ත්‍ර ගිණුමට හර කර ඇත.

(iii) රු. 8,500 ක බැංකු ණයක් එම ගිණුමේ රු. 8,000ක් ලෙස ද, රු. 12,500 ක ණය හිමියෝ එම ගිණුමේ රු. 13,000 ක් ලෙසත් සටහන් වී තිබීම.

(iv) සුදේෂ් ට ණයට විකුණු රු. 10,000 ක භාණ්ඩ පොත්වල දෙවරක් සටහන් වී ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් පෙන්වන්න.

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 10 යි)*

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර විසින් සම්පාදිත යි.